# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2220/19 - 2021 මාර්තු මස 22 වැනි සඳුදා - 2021.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය පිහිටුවමින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද, (2020 ජනවාරි මස 30 වන දින අංක 2160/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) 1986 සැප්තැම්බර් මස 26 වන දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, එම උපලේඛනයේ I වන තීරයේ දක්වෙන "කලා සහ සංස්කෘතික කටයුතු පීඨය" යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II තීරයේ දැක්වෙන ''12. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''13. දෙමළ අධ්‍යයන අධ්‍යයනාංශය''.

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2021 මාර්තු මස 18 වන දින,
කොළඹ දී ය.

04 - 198


1A - PG 5360 — 526 (2021/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*